# ලංකාවිත්ති
## LANKA VITHTHI

මවත් මව්බිමත් ස්වර්ගයට වඩා උතුම්ය!
Mother and Motherland are nobler than Heaven

FOR FREE CIRCULATION
නොමිලේ බෙදාහැරීම පිණිසයි

VOLUME 10
NUMBER 08

ලොව කොතැනවුව වෙසෙන සිංහලයින් සඳහා ලන්ඩනයේ මුද්‍රිත සිංහල පුවත් පත
SINHALA LANGUAGE NEWSPAPER PUBLISHED IN LONDON FOR THE SINHALA READERS WHEREVER THEY ARE.

NOVEMBER 10, 2007 නොවැම්බර් මාසය (බුද්ධ වර්ෂ 2551 ඉල් මාසය)




*Photograph* - Chonil Weerawansa - Sri Lanka

# හිත ඇත්නම්.....!

**සංජය විමලරත්න විසිනි**

**මෙ**යට මාස කීපයකට පෙර වීරෝදාර සටනක් කොට අපේ ආරක්ෂක හමුදා නැගෙණහිර පළාතෙන් කොටි පලවාහරිමින් අත්පත් කොටගත් ජයග්‍රහණය ලාංකික ජනතාවට සැනසිලිදායී වූවා මෙන්ම, කොටින්ගෙන් රට මුදාගැනීමේ වැදගත් ඉදිරි පියවරක් ද වීය. 'මේවාට අපි ප්‍රතිප්‍රහාර දෙනවා' ආදී වශයෙන් කොටි ත්‍රස්තවාදීන් යම් වහසි බස් දෙඩුවද, ගොඩ බිම කරන යුද්ධයෙහි තරමක අස්වැසිල්ලක් ලිහිල්බවක් දැනිණ. ඒත් විවිධ තැන්වල හමුදාව සහ කොටි අතරේ සුළු මට්ටමේ ගැටුම් විටින් විට පැවතිණ. අවි ආයුධ රටට හොරෙන් ගෙන ඒ මේ යෙදුණු කොටි යාත්‍රා රාශියක් ප්‍රහාරයට ලක්කොට ඈත මුහුදේ දී ම අප නාවික හමුදාව ඒවා විනාශකර ලීමට සමත්වීම ද අප ලත් ජයක් වීය. සිත ඇත්නම් අපට මේ සටන ජයග්‍රහණය කරා ඉක්මනින් ගෙන යා හැකිය යන හැඟීම කවුරුත් ධෛර්‍යමත් කරන සුළුවීය.

රජයද කොටින්ගෙන් මුදාගත් නැගෙණහිර ප්‍රදේශවල ජය තහවුරු කර ගැනීම් වස් ජනතාවට යටිතල පහසුකම් සැපයීමවැනි දේවල නිරත විය. නමුත් කොටියා නිශ්ශබ්දව සිටින විට පවා විමසිලිමත් විය යුතුය යන්න අප හැම දාම කී දෙයකි. කොටි නිකම් නොසිට නිදිමරාගෙන ඕවර් ටයිම් වැඩ කරන්නේ අපට විනාශයක් ඇතිකර ලීමට ය. උන් සමග අපේ දීර්ඝ සටන් ඉතිහාසය මෙය දිගටම පෙන්වා දී ඇත.

මෙය සනාථකර ලමින් ඔක්තෝබර් 22 දා අළුයම කොටි ගරිල්ලා කණ්ඩායමක් අනුරාධපුරයේ අප ගුවන් හමුදා මූලස්ථානයට පහරදුන්නේය. 21 දෙනෙකුගෙන් සමන්විත මරාගෙන මැරෙන මේ කණ්ඩායම කඳවුරු සීමාවේ කම්බි වැටවල් කපාගෙන රිංගා ආහ. එක් පැත්තකට ගිය කීප දෙනෙක් කෙරෙහි ගුවන් හමුදා ආරක්ෂක හටයන්ගේ අවධානය යොමුවූ අතරේ දී කොටි වැඩි කොටස ගුවන් යානා නවතා තිබූ පැත්තට ගොස් පහරදීමට පටන් ගත්හ. ගුවන් හමුදාවේ අයගේ ප්‍රති ප්‍රහාරයෙන් මොවුන්ගෙන් 20 දෙනෙක්ම මරුමුවට පත්විය. හමුදා හටයින් 8 දෙනෙක් ද මියගියහ. නමුත් ප්‍රතිඵලය වූයේ හෙලිකොප්ටර් යානා 3 ක් ද, සතුරු ඔත්තු බැලීමේ යොදන විශේෂ වටිනා ගුවන් යානයක් ද විනාශවීම ය. මෙයට අමතරව වටිනා උපකරණ රාශියක් ද විනාශ වූ බව වාර්තාවිය.

මෙම සිද්ධිය වාර්තා කළ ඉන්දියාවේ ද හින්දු පුවත්පත අදහස් දක්වමින් මෙය එල්ටීටීඊයට ඉතා අවශ්‍යව තිබුණු මිලිටරි මෙන්ම දේශපාලනමය අඩුපාඩුවක් සපුරා ගැනීමක් යයි සඳහන් කර තිබිණ. අගෝස්තුවේ නැගෙණහිර පළාතෙන් පලවාහරිනු ලැබූ ඔවුන් මේ දක්වා සැලකිය යුතු ප්‍රතිප්‍රහාරයක් දීමට අසමත්වීය. එයට අමතරව කොටි ත්‍රස්තවාදී සංවිධානය පිට රටින් ආයුධ ගෙන්වීමට යොදාගෙන තිබුණු ඔවුන්ගේ නාවික යාත්‍රා බලකාය ම වන නැව් දහයක්ම ලංකා නාවික හමුදාව විසින් මෑත මුහුදේ දී මෙන්ම ඉන්දුනීසියා මුහුදේ දී ද ගිල්වා විනාශකරනු ලැබිණ. ඔවුන්ගේ හමුදාවල 200 දෙනෙක් පසුගිය මාසයක් ඇතුළත මරුමුවට පත්කරනු ලැබූ අතර උතුරේ මන්නාරම ඔවුන්ගේ බල ප්‍රදේශයේ කඳවුරක්ද ලංකා යුදහමුදාව විසින් ප්‍රහාරය කොට අල්ලාගන්නා ලදී. මේ වාර්තා සියල්ලෙන් එකක් හෝ වැරදියයි හෝ සිදු වුනේ නැතැයි හෝ එල්ටීටීඊය කොතනකවත් උත්තර දී නැතැයි ද හින්දු පවත්පත සඳහන් කරයි.

මේ හැම දේකින්ම පෙන්නුම් කරන්නේ අපේ හමුදාවන්ට හිත ඇත්නම් කළ හැකි දේ ය.

නමුත් අප හමුදාවල දුර්වල පැත්තක්ද ද හින්දු පුවත්පත දක්වයි. එනම් අපේ බුද්ධි අංශයේ ඇති ඌනතාවයි. ඉදිරියේදී උතුර සමග කරන සටනකදී බල කේන්ද්‍රස්ථානයක් වන අනුරාධපුර ගුවන් හමුදා මධ්‍යස්ථානයට කම්බි කපාගෙන කොටි එනතුරු නොදන්නා බුද්ධි මෙහෙයුම කුමක්දැයි හින්දු පත්‍රය අසයි.

පසුගිය සමයේ මේ ගැන විවිධ විමර්ශණ ලංකාවේ පුවත්පත්වල මෙන්ම අන්තර්ජාලයේද එමට පළවිණ. සිද්ධියකට පසු එවැනි සමීක්ෂණ ඉදිරිපත් කිරීමට නම් අපේ අය අති දක්ෂයෝය. මේ හාන්සි පුටු පණ්ඩිතයින් කුමක් කීවද අප හමුදාවල බුද්ධි අංශවල යම් දුර්වලතා ඇති බව කිව යුතුය. එසේම ත්‍රස්ත මර්දන කාර්‍යයේ දී බොහෝ තැන්වල දක්ෂතා ද පෙන්වා ඇත. මේ කරුණු ගැන විශේෂඥ පුහුණුව ලැබූ අය එමට හමුදා තුළ සිටිති. ඒ අය එම ඌනතා ගැන සොයා බලා කටයුතු කොට අවශ්‍ය පරිදි පිළියම් යොදනු ඇතැයි අපේ විශ්වාසයයි.

අනුරාධපුර සිද්ධිය ගැන කොටි ප්‍රචාරක යන්ත්‍රය සුපුරුදු පරිදි උදම් ඇනීම ඇරඹීය. අපේ අය ද දුර්මුඛව සිටියහ. ජාති හිතෛෂීන් කාගේත් සිත්වල වේදනාවක් සේම කණස්සල්ලක් පැවතිණ. සුපුරුදු පරිදි නොවැම්බර් 27 වෙනිදා මහ කොටි ප්‍රභාකරන්ගේ පාරම්බෑමට අනුරාධපුර සිද්ධිය යොදාගනු නියතය යන්න අපි කවුරුත් සිතුවෙමු.

නමුත් මේ තත්වය වැඩි දිනක් නොපැවතිණ. ගිය සතියේ හිමිදිරි උදෑසනක අප ගුවන් යානා විසින් කොටි කේන්ද්‍රස්ථානය වන කිලිනොච්චියටම ගොස් ප්‍රහාරයක් එල්ල කරන ලදී. එම ප්‍රහාරයේදී රැස්වීමක් සඳහා එක්වූ ප්‍රබල කොටින් පස්දෙනෙකු ඇතුළුව කොටි ව්‍යාපාරයේ දෙවෙනියා වූ තමිල් චෙල්වම්ද මරුමුවට පත්කරනු ලැබිණ. මෙම පුවත ලැව් ගින්නක්සේ පැතිර ගිය අතර එය සිංහළ දෙමළ මුස්ලිම් ලාංකිකයින් සියළු දෙන සලිත කරවන්නක් වීය. මෙය වසා දැමීමට බැරිබව ඒත්තු ගත් කොටි සිය වෙබ් ජාලයෙන්ම එම මරණ ගැන ප්‍රචාරය කළහ. අනුරාධපුර සිද්ධිය

(4 වෙනි පිටුව බලන්න) →

උතු රන මුවග ඉපිලෙන සිතෙහි සෙනෙ හස
මතු වුණ නෙතග බැල්මකි හිය විදි ලෙස
සිතු විලි දිගේ යන කල යොවුන් විය දෙස
සතු ටකි දැක්ම නුඹ වැනි සොඳුරු මියු ලැස

♦ දයා ආනන්ද රණසිංහ

## ත්‍රස්තවාදීන්ට අපල කාලයක් මේ

**ලො**ව පුරා ත්‍රස්තවාදීන්ට දැන් ලබා ඇත්තේ මහා නරක දසාවක් බව ඉන්දියාවේ සුප්‍රකට දෛවඥ මෝහන්දාස් ශංකර් මහතා ගිය මාසයේ ඉන්දියාවේ හින්දු පත්‍රයට ලියූ ලිපියක කියා තිබුණි. විශේෂයෙන් අල්කයිඩා හා කොටි සංවිධානය ගැන සඳහන් කළ ඔහු, ප්‍රභාකරන් හා බින් ලාඩන් යන ත්‍රස්තවාදී නායකයන් දෙදෙනාටම මාරක යෙදී ඇති බැවින් ළඟදීම ඔවුන්ගේ අවසානය අසන්නට ලැබෙන බවද කියයි.

මේ අතරේ කොටි සංවිධානයෙන් කැඩී ගොස් දැන් කොටි විරෝධියෙකු ලෙස ක්‍රියාකරන ඊළම් මක්කල් පක්ෂය පිහිටුවාගත් කරුණා පසුගිය සතියේ බොරු පාස්පෝට් එකකින් බ්‍රිතාන්‍යට ඇතුල්වීමේ වරදට ඔහු අල්ලා සිරබාරයට ගත් බව ලන්ඩනයෙන් වාර්තාවෙයි.



හිනාවෙන කොටි ත්‍රස්තවාදියා තමිල් චෙල්වම් ගිය සතියේ මරණයට


